ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

අදියර I විභාගය - 2023 ජනවාරි

## (103) ආර්ථික විද්‍යාව

(Economics)

---

ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රය සඳහා උත්තර සැපයීමේදී බොහෝ විභාග අයදුම්කරුවන් ප්‍රමාණාත්මක මට්ටමින් උත්තර සපයා තිබූ බව පෙනේ. කෙසේවෙතත්, සමස්තයක් වශයෙන් ගත් කළ ඇතැම් ප්‍රශ්න සඳහා බොහෝ අයදුම්කරුවන් සපයා තිබූ උත්තරවල යම් යම් අඩුපාඩුකම් දක්නට ලැබුණි.

ඒ අනුව උත්තරපත් පරීක්ෂා කිරීමේදී ඒ පිළිබඳව උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ නිරීක්ෂණයන් පහත දැක්වේ:

## <u>A කොටස</u>

### ප්‍රශ්න අංක 01

වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න ඇතුළත් මෙම ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. මෙහි ප්‍රශ්න අංක 1.1 සිට 1.10 දක්වා බහුවරණ ප්‍රශ්න 10 කින් සමන්විතය. මෙම කොටස සඳහා බහුතරයක් අයදුම්කරුවන් වැඩි ප්‍රශ්න සංඛ්‍යාවක් සඳහා නිවැරදි පිළිතුරු සපයා තිබූ බව පෙනේ.

අයදුම්කරුවන් සපයා තිබූ පිළිතුරු අනුව පොදුවේ දක්නට ලැබුනු වැරදි කිහිපයක් පහත පරිදි වේ:

**1.1** නිෂ්පාදන සාධක සම්බන්ධයෙන් ආර්ථික සම්පත් ඒවායේ කාර්යයන් පිළිබඳ අවබෝධය මැනීමට දී ඇති ප්‍රශ්නයක් වන, භූමිය සඳහා වන ප්‍රතිලාභය යන්නට බොහෝ අයදුම්කරුවන් නිවැරදි පිළිතුර ලෙස කුළිය තෝරාගෙන තිබුණි.

**1.2** අභිමතානුරූපි ආර්ථක ප්‍රකාශ සම්බන්ධයෙන් දැනුම මැනීමට දුන් මෙම ප්‍රශ්නයට බොහෝ සිසුන් වැරදි පිළිතුරු සපයා ලකුණු ලබාගැනීමට අපොහොසත් වී ඇත.

**1.3** ප්‍රායෝගික දැනුම පරීක්ෂා කරනු ලබන ප්‍රශ්නයකි. මහ බැංකු වාර්තාව වැනි විෂයානුබද්ධ පොත්පත් පරිශිලනය නොකිරීමෙන් අසාර්ථක පිළිතුරු සපයා ලකුණු ලබාගැනීමට අපොහොසත් වි තිබුණි.

**1.4** ආර්ථික විද්‍යාවේ කේන්ද්‍රිය ගැටලුවක් ලෙස සැලකෙන මෙම ප්‍රශ්නයටද බොහෝ සිසුන් වැරදි පිළිතුරු සපයා ලකුණු ලබාගෙන නොතිබුණි.

**1.5** මෙම ප්‍රශ්නය වෙළඳපොල හා පාරිභෝගික හැසිරීම පිළිබඳ අවධානය යොමුකළ ප්‍රශ්නයක් වුවත් බොහෝ අයදුම්කරුවන් හට නිවරුදි පිළිතුරු සපයා ලකුණු ලබාගැනීමට අපොහොසත් වි ඇත.

**1.6** ඉල්ලුම් නම්‍යතාවයෙහි ප්‍රභේද පිළිබඳ දැනුම මැනීමට මෙම ප්‍රශ්නය දී ඇත. බොහෝ අයදුම්කරුවන් වැරදි පිළිතුරු ලියා ලකුණු ලබාගෙන නොමැත. සීමිත අයදුම්කරුවන් ප්‍රමාණයක් පමණක් ඒ සඳහා ලකුණු ලබාගෙන ඇත.

1.7 වෙළඳපොල ක්‍රියාවලියට, රජය මැදිහත් වන ආකාර ගැන සිසුන්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්නය දී ඇත. මෙම ප්‍රශ්නයකට බොහෝ සිසුන් නිවැරදි පිළිතුරු සපයා ලකුණු ලබාගෙන තිබුණි.

1.8 පරිමාණානුකූල ඵල නීතිය යටතේ දැනුම පරීක්ෂා කිරීම සඳහා දී ඇති මෙම ප්‍රශ්නයට නියමිත පිළිතුරු සපයා ලකුණු ලබාගෙන තිබුණි.

1.9 වෙළෙඳපොල ව්‍යුහයන්හි ලක්ෂණ පිළිබඳ පරීක්ෂා කිරීමට දී ඇති මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් ලකුණු ලබාගෙන තිබුණ බව පෙනේ.

1.10 ව්‍යාපාර චක්‍රය පිළිබඳ නිවැරදි අවබෝධය පරීක්ෂා කිරීමට දී ඇති මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා ඇත.

1.11 මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකයේ ප්‍රායෝගික වැදගත්කම ගැන දැනුම මැන බැලීමට දී ඇති මෙම ප්‍රශ්නයට ද බොහෝ අයදුම්කවරුන් "ධන" ලෙස සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

1.12 වෙළඳපොල ව්‍යුහයන් වල ලක්ෂණ සහ කෙටිකාලයේදී හා දිගුකාලයේදී එම ව්‍යුහයන් වල හැසිරීම ගැන පරීක්ෂා කිරීමට දී ඇති මෙම ප්‍රශ්නය බොහෝ අයදුම්කරුවන් වැරදි පිළිතුරු ලියා ඇත්තේ අනවබෝධය නිසා බව ලබාගෙන ඇති අඩු ලකුණු මගින් ඔප්පුවී ඇත. නිවැරදි පිළිතුර වන්නේ ඒකාධිකාරී තරඟයයි.

1.13 රටක මුදල් සැපයුම පරීක්ෂා කිරීමට දී ඇති මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් සාර්ථක ලෙස පිළිතුරු සපයා තිබුණි.

1.14 මූලික ආර්ථික ප්‍රශ්න පිළිබඳ අවබෝධය පරීක්ෂා කිරීමට ඉදිරිපත් කර ඇති මෙම ප්‍රශ්නයට. බොහෝමයක්ම අයදුම්කරුවන් "සත්‍ය" යන නිවැරදි පිළිතුර සොයා ලකුණු ලබාගෙන තිබුණි.

1.15 සූක්ෂම ආර්ථික විද්‍යාව සහ සාර්ව ආර්ථික විද්‍යාව ගැන අසා ඇති මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා නැත.

1.16 මිල හා ඉල්ලුම් ප්‍රමාණය අතර ඇති ප්‍රතිලෝම සම්බන්ධතාවයට හේතුවන ආදායම් ප්‍රතිවිපාකය ගැන සමහර අයදුම්කරුවන් ලියූ පිළිතුරු අතර, ඉල්ලුම් නීතියට හේතුව ආදායම් ප්‍රතිවිපාකය ලෙස ලියා ලකුණු ලබාගෙන නොමැත.

1.17 තේරීම හා ආවස්ථික පිරිවැය අතර වෙනස, බොහෝ අයදුම්කරුවන් ලකුණු ලබාගත් ප්‍රශ්නයකි.

1.18 ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන් දෙකක් පිළිබඳව ලිවීමේදී සමහර අයදුම්කරුවන්ට මහ බැංකුවේ කාර්යයන් පිළිබඳව නිරවුල් අවබෝධයක් නොමැතිබව, පිළිතුරු දෙස බැලීමෙන් අවබෝධ විය.

1.19 බොහෝමයක්ම අයදුම්කරුවන්ට උපේක්ෂා වක්‍ර පිළිබඳ අවබෝධය මඳ බව පෙනේ. ලකුණු කිසිවක් ලබානොගත් අයදුම්රුවන් බොහෝ විය.

1.20 තිරසාර සංවර්ධනය යන්නට සාමාන්‍ය දැනුම හා අවබෝධයකින් යුතුව, බොහෝ අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු සහ ආසන්න වශයෙන් පිළිතුරු ලියා ලකුණු එකක් හෝ ලබාගැනීමට සමත් විය.

## B කොටස

(එක් කොටසකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 4 කි.)

### ප්‍රශ්න අංක 02

**(a)** **(i)** බහුතරයක් අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි.

**(ii)** කෙසේවෙතත්, රු.30/- ක ඒකක බද්ද පැනවීමෙන් පසු වෙළෙඳපොළ සමතුලිතය නිවැරදිව ගණනය කිරීමට බොහෝ අයදුම්කරුවන් අසමත්ව තිබූ බව පෙනුණි. ඒ පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවන බව පෙනේ.

**(b)** බොහෝ අයදුම්කරුවන් "පාරිභෝගික සමතුලිතය" යන්න වෙළෙඳපොළ සමතුලිතය ලෙස තේරුම්ගෙන පිළිතුරු සපයා සපයා තිබූ බව දක්නට ලැබුණි.

### ප්‍රශ්න අංක 03

**(a)** ආර්ථික භාණ්ඩ හා ආර්ථික නොවන භාණ්ඩ අතර වෙනස එකිනෙකට උදාහරණ සපයමින් පැහැදිලි කිරීමට දී ඇත. බොහෝ සිසුන් මෙම භාණ්ඩ දෙක අතර වෙනස නිවැරදිව ඉදිරිපත් කළ ද සමහර සිසුන්, කවුරුන් විසින් හෝ සම්පත් පිරිසක් දරා ඇත්ද යන කරුණ මත මෙම භාණ්ඩ දෙක අතර වෙනස සිදුවන බව හඳුනාගෙන නොමැත.

**(b)** සාමාන්‍ය විචල්‍ය පිරිවැය සඳහා බොහෝ අයදුම්කරුවන් වැරදි පිළිතුරු සපයා තිබුණි.

**(c)** නිෂ්පාදන ක්‍රියාවලියේදී පිරිවැයෙහි හැසිරීම සම්බන්ධයෙන් සිසුන්ගේ දැනුම පරීක්ෂා කිරීමට දී ඇති මෙම ආන්තික පිරිවැය හා ආන්තික ආදායම පිළිබඳ ප්‍රශ්නයට සමහර සිසුන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණ ද, සමහර සිසුන් ආන්තික යන සංකල්පය නොසලකා හැර පිළිතුරු සපයා ඇත.

### ප්‍රශ්න අංක 04

බහුතරයක් අයදුම්කරුවන් පොදුවේ මෙම ප්‍රශ්නයේ සියලු කොටස් සඳහා සාර්ථක ලෙස පිළිතුරු සපයා තිබුණි. බොහෝවිට ප්‍රායෝගිකව මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමට උත්සාහ දරා තිබුණි.

### ප්‍රශ්න අංක 05

**(a)** බොහෝ අයදුම්කරුවන් නිවැරදිව ඩොලර් ඉල්ලුම් කිරීමට හේතු සඳහන් කර තිබුණි.

**(b)** මෙම ප්‍රශ්නයේදී සමහර අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු සපයා තිබුණද, බොහෝ අයදුම්කරුවන් නිවැරදිව අදාල සංකල්ප පිළිබඳව අවබෝධයෙන් යුතුව සාපේක්ෂ වාසි ගණනය කර තිබුණේ නැති බව පෙනේ.

**(c)** ගෙවුම් ශේෂ ලේඛනය තුල ඇතුලත් කළ යුතු කරුණු වලට බැංකු ණය ගෙවීම්, ණය හිමියන්ට ගෙවීම් ආදි කරුණු ලියා ලකුණු ලබා නොගත් අයදුම්කරුවන් බොහෝ වේ. සමහර අයදුම්කරුවන් ඉතා පැහැදිලි ලෙස සාර්ථකව කරුණු ඉදිරිපත් කර තිබුණි.

## C කොටස

### ප්‍රශ්න අංක 06

**(A)** **(a)** **(i)** වෙළඳපොල මිලට දළ දේශිය වියදම සෙවිමේදී සමහර සිසුන් විසින් ඒ සඳහා අපනයන හා ආනයන දත්ත ද ඇතුළත් කර තිබීමෙන් සම්පූර්ණ ලකුණු ලබාගැනීමට නොහැකිවී තිබුණි.

**(ii)** වෙළඳපොල මිලට දළ දේශිය නිෂ්පාදිතය සෙවිමේදී තොග වෙනස්වීමේ දත්තද, දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය ද එයට ඇතුල් කිරීමෙන්, සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට නොහැකි විය.

**(iii)** වෙළඳපොල මිලට දළ ජාතික ආදායම සෙවිමේදී, අපනයන හා ආනයනය වියදම නැවත ඇතුළත් කර, එයට ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම ගැලපීම නිසා මෙම කොටසට හිමි මුල ලකුණු ලබාගැනීමට නොහැකි වී ඇත.

**(b)** ජාතික ගිණුම්කරණයේ "මූලික මිල" යන්න නිවැරදිව ඉදිරිපත් කිරීමට බොහෝ සිසුන් පොහාසත් වී ඇත. මූලික මිල යන සරල සංකල්පය පිළිබඳව අයදුම්කරුවන්ට මනා අවබෝධයක් ලබාදිය යුතුය**.**

**(B)** සාර්ව ආර්ථික ප්‍රතිපත්ති දෙකක් පැහැදිලි කළ යුතු වුවද, බොහෝ අයදුම්කරුවන් ඊට වඩා වැඩි ප්‍රමාණයක් විස්තර කර තිබුණි. අයදුම්කරුවන් දී ඇති ප්‍රශ්නය නිවැරදිව අවධාරණය නොකිරීමෙන් හා දැනුවත් නොවීම නිසා මෙය සිදුවී ඇත. සමහර අයදුම්කරුවන් ඉතා පැහැදිලිව අරමුණු දෙකක් පමණක් නම් කර තිබුණි.

**(C)** **(a)** බොහෝ අයදුම්කරුවන් මෙම කොටසට එනම් පුනරාවර්තන වියදම් යන්න නිවැරදිව පැහැදිලි කර මුළු ලකුණු ප්‍රමාණයම ලබාගෙන තිබුණි.

**(b)** පුනරාවර්තන වියදම් වර්ග දෙකක් නම් කිරීමට දී ඇති මෙම ප්‍රශ්නයට සමහර සිසුන් ප්‍රධාන වර්ග වන භාණ්ඩ හා සේවා මත දරණ වියදම්, සංක්‍රාම වියදම් හා පොලී ගෙවීම් ලෙස ලියා ඇති අතර, සමහර සිසුන් මේ ප්‍රධාන වියදම් වර්ග තුන අතර ඇති වියදම් වර්ග වල නම් යටතේ ද, උප වියදම් වර්ග ලෙස ඉදිරිපත් කර ලකුණු ලබා ගන්නා ලදී.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනිමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

(1) විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති උත්තර පිළිබඳව නිශ්චිත සෘජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම්/විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථනවලට අනුකූලවෙමින් උත්තර ලියන්න.

(4) මෙම විෂයට අදාළ ස්ව-අධ්‍යයන පාඩම් මාලාව, ග්‍රන්ථ, අත්පොත් ලිපි, සඟරා, මහ බැංකු වාර්තා ආදිය මැනවින් පරිශීලනය කිරීම.

(5) උත්තර ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුලින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සංසන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

(10) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(11) උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසි පරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

(12) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත්වීම.

- * * * -